# මාධ්‍ය නිවේදනය

**ජාතික ගිණුම් ඇස්තමේන්තු; 2021 වර්ෂයේ දෙවන කාර්තුව සඳහා**

**2021 වර්ෂයේ දෙවන කාර්තුවේ ශ්‍රී ලංකාවේ ආර්ථිකය සියයට 12.3 කින් වර්ධනයවී ඇත.**

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

**ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය**

දු.ක: 94-11-2147053 ෆැක්ස්: 94-11-2877938 ඊමේල්: national.accounts@statistics.gov.lk

……………………………………………………………………………………………………..

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2021 දෙවන කාර්තුව (අප්‍රේල් 1 සිට ජුනි 30) සඳහා නිෂ්පාදන ප්‍රවේශය යටතේ පවත්නා මිල සහ ස්ථාවර මිල (2010) යටතේ දළ දේශීය නිෂ්පාදිතය සහ අනෙකුත් සාර්ව ආර්ථික දර්ශක ඇස්තමේන්තු කර නිකුත් කොට ඇත.

2021අප්‍රේල් මස අවසානයේ කොවිඩ් -19 වසංගතයේ තුන්වන රැල්ල ආරම්භ වන තුරු ශ්‍රී ලංකා ආර්ථිකය 2020 වසරේ දෙවන කාර්තුව හා සසඳන විට 2021 වසරේ දෙවන කාර්තුවේ දී සතුටුදායක මට්ටමක පැවතිණි. කොවිඩ් -19 වසංගතය සඳහා වූ යම් යම් සෞඛ්‍ය අනතුරු ඇඟවීම් සහ පූර්වාරක්ෂාවන් යටතේ වුව ද, පසුගිය වසරේදී මෙන් නොව, මෙවර සිංහල හා දෙමළ අලුත් අවුරුදු උත්සවය සැමරීමට ශ්‍රී ලාංකික ප්‍රජාවට හැකි විය. ව්‍යාපාරික කටයුතු සීමා කිරීම, සංචරණ සීමා , සෞඛ්‍ය පූර්වාරක්ෂක විධි වැනි දීර්ඝ සීමා පැනවීමකින් පසු සමාජයේ බොහෝ පිරිසක් මෙම සහනය මහත්සේ භුක්ති වින්දහ. මෙහි ප්‍රතිඵලයක් ලෙස, විශේෂයෙන් අප්‍රේල් මාසයේදී, මෙම සාමකාමී පරිසරය, විදේශ සංචාරකයින් පැමිණීම හා සම්බන්ධ ව්‍යාපාර හා විනෝදාස්වාද ආශ්‍රිත ව්‍යාපාර හා සංස්කෘතික කටයුතු වැනි ඉතා සුළු ප්‍රමාණයක් හැර බොහෝ ව්‍යාපාර කටයුතු හොඳින් කරගෙන යාමට සතුටුදායක ලෙස බලපෑවේය.

සිංහල අලුත් අවුරුදු උත්සවය නිමා වූ විගස, අප්‍රේල් මාසය අවසානයේ දිවයිනේ සෑම දිස්ත්‍රික්කයකින්ම කොවිඩ් -19 ආසාදිත රෝගීන් සංඛ්‍යාවේ ඉහළ වර්ධනයක් වාර්තාවෙමින් කොවිඩ් 19 වසංගතයේ තුන්වන රැල්ලේ බලපෑම ඉහළ ගියේය. මෙම කොවිඩ් -19 වසංගතය සහ එහි ඩෙල්ටා නව ප්‍රභේදය දිවයින පුරා සීඝ්‍රයෙන් ව්‍යාප්ත වීම හේතුවෙන්, එය පැතිරීම වැළැක්වීම සඳහා රජය විසින් මැයි 21 දා සිට නැවත දිවයිනම ආවරණය වන පරිදි සංචරණ සීමා පැනවීමට තීරණය කරන ලදී. කෙසේ වෙතත් 2020 වර්ෂයේ අගුළු දැමීමේ කාල සීමාවේ ස්වභාවය හා සසඳන විට මෙම තත්වය පසුගිය වසරේ රට සම්පූර්ණයෙන්ම පාහේ අගුළු දැමීමේ කාලය තරම් දැඩි නොවීය. සියලුම කෘෂිකර්මාන්ත ආශ්‍රිත කටයුතු, බොහෝ නිෂ්පාදන කර්මාන්ත කටයුතු, ඉදිකිරීම් කටයුතු සහ සේවා ආශ්‍රිත බොහෝ ව්‍යාපාර කටයුතු සඳහා මෙම සංචරණ සීමා කාලය තුළදීත් සිය කාර්යයන් අඛණ්ඩව කරගෙන යාමට රජය අවසර දෙන ලදී. 2020 වසරේ දෙවන කාර්තුවේ පැවති රට අගුළු දැමීමේ ස්වභාවය හා සසඳන විට මෙම වසරේ දෙවන කාර්තුවේ දී අඛණ්ඩව

ව්‍යාපාර කටයුතු කරගෙන යාමට මෙය යම් වාසිදායක වාතාවරණයක් නිර්මාණය කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස බොහෝ ආර්ථික හා ව්‍යාපාරික කටයුතු වල 2020 දෙවන කාර්තුව හා සසඳන විට ප්‍රසාරණය වීමක් වාර්තා කර ඇත.

2019 වසරේ දෙවන කාර්තුවේ දී වාර්තා වූ රුපියල් මිලියන 2,312,528 ක සිට මූර්ත දළ දේශීය නිෂ්පාදිතය 2020 වසරේ දෙවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිත ඇස්තමේන්තු වලට අනුව රුපියල් මිලියන 1,932,319 දක්වා අඩු විය. එහි ප්‍රතිඵලයක් ලෙස දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය සියයට 16.4 ක ඍණාත්මක වර්ධනයක් වූ අතර එය ශ්‍රී ලංකා ඉතිහාසයේ මෙතෙක් වාර්තා වූ දළ දේශීය නිෂ්පාදිත වර්ධන වේගයන්හි විශාලතම පහත වැටීමයි. ඒ අනුව, 2021 වසරේ දෙවන කාර්තුවේ දී දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය ගණනය කරනුයේ 2020 වසරේ එසේ පහත වැටුණු මූර්ත දළ දේශීය නිෂ්පාදිතය පදනම් කරගෙන ය.

2021 වර්ෂයේ දෙවන කාර්තුව සඳහා ජාතික ගිණුම් ඇස්තමේන්තු නිකුත් කිරීම පිළිබඳ ප්‍රකාශයක් නිකුත් කරමින්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව අනාවරණය කරන්නේ, 2021 වර්ෂයේ දෙවන කාර්තුවේ ආර්ථික වර්ධන වේගය සියයට 12.3 ක ධනාත්මක වර්ධන වේගයක් ලෙස ඇස්තමේන්තු කර ඇති බව යි. පසුගිය වසරේ දෙවන කාර්තුවේ දී වාර්තා වූ ආර්ථිකයේ සියයට 16.4 ක සංකෝචනය වූ පසුබිම මත මෙම ධනාත්මක වර්ධන වේගයට පැමිණ ඇත.

තවද, 2021 දෙවන කාර්තුව සඳහා ස්ථාවර මිල ගණන් යටතේ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය රුපියල් මිලියන 2,170,052 දක්වා ඉහළ ගොස් ඇති අතර එය 2020 වර්ෂයේ දෙවන කාර්තුවේ රුපියල් මිලියන 1,932,319 ක් ලෙස වාර්තා විය. කෙසේ වෙතත්, පහත රූප සටහන මගින් ආර්ථිකය තවමත් අවම වශයෙන් 2019 දෙවන කාර්තුවේ වාර්තා වූ දළ දේශීය නිෂ්පාදිතයේ මට්ටමට ළඟා වී නැති බව පැහැදිලිව පෙන්නුම් කරයි.

දෙවන කාර්තුවේ මූර්ත දළ දේශීය නිෂ්පාදිත මට්ටම් සැසඳීම **(2018 - 2021)**



ඊට අමතරව 2021 වර්ෂයේ දෙවන කාර්තුවේ පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතය රුපියල් මිලියන 3,626,482 ක් දක්වා වර්ධනය වී ඇති අතර එය 2020 වර්ෂයේ දෙවන කාර්තුවේ දී පවත්නා මිල ගණන් යටතේ රුපියල් මිලියන 3,007,345 ක් ලෙස වාර්තා වූ දළ දේශීය නිෂ්පාදිතයේ සියයට ධන 20.6 ක වෙනසක් පෙන්වයි.

ආර්ථිකයේ ප්‍රධාන සංරචක තුන වන "කෘෂිකර්ම", "කර්මාන්ත", සහ "සේවා" පවත්නා මිල යටතේ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයට දක්වනු ලබන දායකත්වයන් පිළිවෙලින් සියයට 9.2ක්, සියයට 27.0 ක්, සියයට 57.9 ක් වන අතර "භාණ්ඩ මත අය කෙරෙන සහනාධාර අඩු කළ බදු" සංරචකය 2021 වර්ෂයේ දෙවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතයට සියයට 5.8 ක දායකත්වයක් ලබා දී ඇත.

2021 වර්ෂයේ දෙවන කාර්තුවේ දී කෘෂිකාර්මික, කර්මාන්ත සහ සේවා යන ආර්ථික ක්‍රියාකාරකම් ත්‍රිත්වයම පිළිවෙලින් සියයට 8.1, සියයට 22.1, සියයට 7.5 ක සැලකිය යුතු ධනාත්මක වර්ධන වේගයන් වාර්තා කර ඇත. පසුගිය වසරේ දෙවන කාර්තුවේ දී මෙම ක්‍රියාකාරකම් වල වාර්තා වූ පසුබැසීම්වල ප්‍රතිඵලයක් ලෙස මෙම වාර්තා ගත ඉහළ වර්ධන වේගයන් වෙත ළඟා **වී ඇත**.

**කෘෂිකර්මික ආර්ථික කටයුතු වල වර්ධනයන්**

2021 වර්ෂයේ දෙවන කාර්තුවේ දී සංචරණ සීමා කාලය තුළදී වුව ද, කෘෂිකර්මාන්තය ආශ්‍රිත සියලු කටයුතු අඛණ්ඩව කරගෙන යාමට රජය අවසර ලබා දීම හේතුවෙන් සමස්තයක් ලෙස කෘෂිකාර්මික ආර්ථික කටයුතු 2020 වර්ෂයේ දෙවන කාර්තුවේ වාර්තා වූ සියයට 8.2 ක ඍණාත්මක වර්ධනය හා සසඳන විට සියයට 8.1 කින් සැලකිය යුතු ලෙස ප්‍රසාරණයවී තිබේ. බොහෝ කෘෂිකාර්මික කටයුතු ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත. විශේෂයෙන්, 'කරදිය ධීවර කටයුතු' (සියයට 24.7), 'සත්ව නිෂ්පාදනය'(සියයට 18.0), 'රබර් වගා කිරීම' (සියයට 15.7), 'පොල් ඇතුලත් තෙල් සහිත පළතුරු බෝග වගාව' (සියයට 14.0), 'තේ වගා කිරීම' (සියයට 13.4), 'මිරිදිය ධීවර කටයුතු' (සියයට 7.6), 'ධාන්‍ය වගා කිරීම' (සියයට 6.6), 'පළතුරු වගා කිරීම' (සියයට 6.5), ) 'කුළු බඩු වගා කිරීම' (සියයට 4.7), 'වන වගා සහ දැව' (සියයට 4.2) ලෙස වර්ධනය වී තිබේ.
කෙසේ වෙතත්, මෙම කාර්තුව තුළ 'වී වගා කිරිම (සියයට -5.1), 'එළවළු වගා කිරීම' (සියයට -4.5) සැලකිය යුතු ලෙස පසුබෑමට ලක්වී ඇත.

**කර්මාන්ත ආර්ථික කටයුතු වල වර්ධනයන්**

2021 වර්ෂයේ දෙවන කාර්තුව තුළ සමස්ත කාර්මාන්ත ආර්ථික කටයුතු සියයට 22.1 ක සැලකිය යුතු මට්ටමේ වර්ධනයක් වාර්තා කර ඇත. කෙස් වෙතත් දළ එකතු කළ වටිනාකම 2019 වර්ෂයේ මට්ටම දක්වා තවමත් ළඟා වී නොමැත. මෙම ධනාත්මක වර්ධනයට මූලික වශයෙන් හේතු වී ඇත්තේ 2020 වර්ෂයේ දෙවන කාර්තුව තුළ සිදු වූ ආර්ථිකයේ පසුබෑමයි.

2020 වර්ෂයේ දෙවන කාර්තුවට සාපේක්ෂව 2021 වර්ෂයේ දෙවන කාර්තුවේ සමස්ත නිමවුම් කර්මාන්තය සියයට 26.5 කින් ඉහළ ගොස් ඇත. දළ දේශීය නිෂ්පාදිතයට සියයට 4.4 ක දායකත්වයක් සපයන 'රෙදිපිළි, නිමි ඇඳුම්, සම්භාණ්ඩ සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන' සියයට 60.7 කින් වර්ධනය වී ඇත. අනෙකුත් නිමවුම් කර්මාන්ත කටයුතු වන; 'රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදන' (සියයට 66.8), ගෘහ භාණ්ඩ නිෂ්පාදනය (සියයට 54.4), 'අනෙකුත් ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන' (සියයට 41.3), 'වෙනත් නිමවුම් කර්මාන්ත'

(සියයට 28.1), ‘රසායනික ද්‍රව්‍ය නිෂ්පාදන’ (සියයට 13.0), ලෙස ඉහළ ධනාත්මක වර්ධන වේගයන් වාර්තා කර ඇත.

කාර්මාන්ත අංශයේ කටයුතු අතර, සමස්ත කර්මාන්ත අංශය සඳහා සියයට 6.8 ක දායකත්වයක් සපයන ‘ඉදිකිරීම් කර්මාන්තය’ 2020 වර්ෂයේ දෙවන කාර්තුවට සාපේක්ෂව සියයට 18.2 ක සැලකිය යුතු වර්ධනයක් 2021 වර්ෂයේ දෙවන කාර්තුවේ දී වාර්තා කර ඇත. ඉදිකිරීම් කර්මාන්තයේ සිදු වූ මෙම වර්ධනය අනුව යමින් ‘පතල් හා කැනීම්’ කටයුතු මෙම කාර්තුව තුළ සියයට 17.9 ක ධන වර්ධන වේගයක් වාර්තා කර ඇත. මේ අතර, ‘විදුලිය, ගෑස්, වාෂ්ප සහ වායු සැකසුම් සැපයුම’ සියයට 12.8 ක ධන වර්ධන වේගයක් වාර්තා කර ඇත. තවද ‘ජලය එක් රැස් කිරීම, පිරිපහදු කිරීම සහ බෙදා හැරීම’ සියයට 3.2 ක ධන වර්ධන වේගයක් මෙම කාර්තුව තුළ දී වාර්තා කර ඇත

**සේවා ආර්ථික කටයුතු වල වර්ධනයන්**

සේවා අංශය ද සියයට 7.5 ක ධන වර්ධනයක් වාර්තා කර ඇත. සේවා අංශයෙහි මෙම ප්‍රසාරණය සඳහා 'තොරතුරු තාක්ෂණ සේවා' (සියයට 24.2), ‘ප්‍රවාහනය’ (සියයට 20.4), 'විදුලි සංදේශ සේවා' (සියයට 19.6), ‘රක්ෂණ සේවා’ (සියයට 14.4), 'මූල්‍ය සේවා' (සියයට 14.3) යන උප ආර්ථික කටයුතු වල සිදු වූ වර්ධනය විශේෂයෙන් ඉවහල් වී ඇත. ඊට අමතරව, දේපළ වෙළඳාම (සියයට 5.5), 'වෘත්තීය සේවා' (සියයට 3.4), 'අනෙකුත් පෞද්ගලික සේවා' (සියයට 2.6), සහ ‘තොග හා සිල්ලර වෙළඳාම’ (සියයට 1.0), ලෙස ප්‍රසාරණය වී ඇත.

ඊට අමතරව මෙම කාර්තුවේ දී ‘නවාතැන් හා ආහාර පාන සැපයීම’ සියයට 42.6 ක වර්ධනයක් වාර්තා කර ඇත. එයින් මෙම ආර්ථික ක්‍රියාකාරකම යථා තත්වයට පත්වීමක් පිළිබිඹු නොකරයි. සියයට 42.6 ක වර්ධනයක් වාර්තා වී ඇත්තේ පසුගිය වසරේ දෙවන කාර්තුවේ වාර්තා වූ තියුනු පසුබෑම (සියයට 63.6) හේතුවෙනි. 2020 වර්ෂයේ දෙවන කාර්තුව හා සසඳන විට 2021 දෙවන කාර්තුවේ පැවති තත්වය ‘නවාතැන් හා ආහාර පාන සැපයීම’ කටයුතු සඳහා හිතකර ලෙස බලපෑවේය. තවද 2019 වර්ෂයේ දෙවන කාර්තුවේ දී මෙම ක්‍රියාකාරකම සඳහා දළ එකතු කළ වටිනාකම රුපියල් මිලියන 34,123 ක් විය. පසුගිය වසරේ දෙවන කාර්තුවේ දී එය රුපියල් මිලියන 12,437 දක්වා සීග්‍ර ලෙස පහත වැටී ඇත. කෙසේ වෙතත් මෙම කාර්තුවේ දී එය නැවත රුපියල් මිලියන 17,738 දක්වා වර්ධනය වී ඇත.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව ප්‍රකාශ කරන පරිදි, 2021 වර්ෂයේ දෙවන කාර්තුව සඳහා දළ දේශීය නිෂ්පාදිතයේ ඇස්තමේන්තු පිළිබඳ විස්තරාත්මක තොරතුරු ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ පළ කර ඇත..

www.statistics.gov.lk/NationalAccounts/StaticalInformation/GDP

පී.එම්.පී. අනුර කුමාර

අධ්‍යක්ෂ ජනරාල්